## සංක්ෂිප්තය

පාසල හා ප්‍රජාව අතර සම්බන්ධතාවයෙහි ස්වභාවය පිළිබඳව විමර්ශනය කරන ලද මෙම පර්යේෂණයේදී පාසල සමාජයේ හුදකලාවූ කුඩා සමාජ ඒකකයක් ලෙස නොව සමස්ත සමාජයේම සුභසිද්ධිය සඳහා මුල්වන ආයතනයක් ලෙස සැලකිණ. ප්‍රජාව පාසලේ කාර්යයන්ට සක්‍රීයව සහභාගීවිය යුතු බව මෙන්ම පාසල ප්‍රජාවගේ සංවර්ධනයට යම් මෙහෙවරක් කළ යුතුය යන්න බොහෝ තැන්හි අවධාරණය වී ඇත. පාසලට සම්බන්ධව ඇති ප්‍රජාවේ තරාතිරම ප්‍රමාණය මත පාසල්වල ගුණාත්මක සංවර්ධනය තීරණය වන බව මෙන්ම පාසල ගුණාත්මක බවින් හා සාර්ධර්මවලින් පොහොසත් වන තරමට ප්‍රජාවට ලැබෙන ප්‍රතිලාභ ද වැඩි වන බව පිළිගැනීමයි. මෙයින් අවධාරණය වන්නේ පාසල හා ප්‍රජාව අතර යහපත් වු සබඳතාවය සමස්ත සමාජය කෙරෙහිම ධනාත්මක බලපෑම් එල්ලකිරීමට හේතුවන බවයි. වර්තමාන ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියේ සැකැස්ම දෙස බලන විට පාසල් ප්‍රජා සම්බන්ධතා විවිධ වන අතර ඉන් ලැබෙන ප්‍රතිඵලද විවිධය. සෑම පාසලකටම පාහේ අනන්‍යවු ප්‍රජාවක් සිටින බැවින් ඔවුන්ගේ අවශ්‍යතා මෙන්ම ජීවනෝපාය මාර්ග වැඩි දියුණු කර ගැනීම සඳහා ද පාසලින් යමක් විය යුතුය යන්න ජාත්‍යන්තර පාසල් ප්‍රජා සබඳතා ව්‍යවහාර තුළින් ද හෙළිවී ඇත. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ පාසල් ප්‍රවර්ධන වැඩ සටහන නැතහොත් පාසල් නගා සිටුවීමේ වැඩසටහන (P.S.I.) මගින් ද පාසල් ප්‍රජා සබඳතා තුළින් වඩාත් හොඳ ගුණාත්මක අධ්‍යාපනයක් ඉලක්කකොට ඇත. මෙවනි පසුබිමක් තුල මෙරට පාසල්, ප්‍රජාව හා සම්බන්ධතා පවත්වන ආකාරය හා එහි විශේෂතා අනාවරණය කර ගැනීම වැදගත් වනු ඇත.

මේ අනුව අද්‍යයතන අධ්‍යයනය මගින් පාසල හා ප්‍රජාව අතර පවතින සම්බන්ධතාවය විමසා බැලීම පාසල හා ප්‍රජාව අතර සම්පත් හුවමාරුවන ආකාරය විමසා බැලීම ප්‍රජා සම්බන්ධතා පාසලේ විෂය හා විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා දායක වී ඇති ආකාරය හා පාසල් ප්‍රජා සබඳතා පිළිබඳ ගුරු විදුහල්පති ආකල්ප විමසිම යන සුවිශේෂ අරමුණු පිළිබඳව විමර්ශනයෙහි යෙදුනු අතර පාසල් ප්‍රජා සබඳතා වැඩි දියුණු කිරීම සඳහා පිරික්සෙනන්ගේ යෝජනා විමසීමද සිදුකරන ලදී.

මාතර දිස්ත්‍රික්කයේ 1 AB පාසල් වලින් පාසල් 06 ක් ද, I C පාසල් අතුරින් පාසල් 09 ක් ද නියැදිය සඳහා යොදාගන්නා ලදී. මෙහිදි තෝරා ගත් අධ්‍යාපන කලාප තුනකින් එක් කලාපයකින් 1 AB පාසල් දෙක බැගින් ද, 1 C පාසල් තුන බැගින් ද, වනසේ පාසල් නියැදිය තෝරා ගැනිණ. අද්‍යතන අධ්‍යයනය සඳහා දත්ත ලබා ගැනීමට ගුරු, විදුහල්පති, දෙමාපිය හා ආදි ශිෂය කොටස්වලින් සමන්විත වු 195 දෙනෙකු සහභාගී කරවාගන්නා ලදී. මෙම පර්යේෂණය සඳහා විස්තරාත්මක පර්යේෂණ ප්‍රවේශය යටතේ නියැදි සමික්ෂණ ක්‍රමය යොදා ගන්නා ලදී. ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා දත්ත රැස්කිරීමේ ශිල්පක්‍රම ලෙස භාවිතා කළ අතර ප්‍රතිශත වගු හා විස්තරාත්මක අර්ථකථනය ඇසුරින් දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී.

පාසල හා සම්බන්ධතා පවත්වන ප්‍රජා කණ්ඩායම් අතර දෙමාපියන් හා පාසල් සංවර්ධන සමිතිය හැරුණු විට සෙසු ප්‍රජාවගේ සබඳතා මට්ටම් යහපත් තත්වයක නොපවතින බව අනාවරණය කර ගත හැකි විය.

පාසලට ප්‍රජාව සම්බන්ධ කර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් නොමැති බව අනාවරණය වු අතර ඇතැම් ප්‍රජා කොටස් පාසල හා සම්බන්ධ වීමට කැමැත්තෙන් පසුවන බව ද හෙළි විය. පාසල හා ප්‍රජාව අතර සම්පත් හුවමාරුවේදී ප්‍රජාව හා පාසල යන දෙපාර්ශවයේම ක්‍රියාකාරිත්වය සතුටුදායක නොවන බව අනාවරණය විය. පාසලේ විෂය හා විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ප්‍රජා දායකත්වය විෂය සංවර්ධනයේදී ඉතා පහල මට්ටමක් පෙන්නුම් කළ අතර විෂයසමගාමි ක්‍රියා සඳහා දායකවීමේදී ක්‍රීඩා හා ආගමික වැඩසටහන්වලදී පමණක් යහපත් මට්ටමකින් පෙන්නුම් කර ඇත.

සමස්තයක් ලෙස ගත් විට පාසල් ප්‍රජා සම්බන්ධතා පවත්වාගැනීම පිළිබඳ ගුරු විදුහල්පති ආකල්ප යහපත් මට්ටමක පවති. ප්‍රජාව වෙනුවෙන් පාසලින් ඉටු විය යුතු විවිධ කාර්යයන් පවතින බව ප්‍රජාව විසින් ඉදිරිපත් කළ යෝජනාවලින් තහවුරු වී ඇති අතර ප්‍රජා සම්බන්ධතා ඇති කර ගැනීමට පාසලේ අභ්‍යන්තර ප්‍රජාව ලෙස ගුරු, විදුහල්පති යන දෙපාර්ශවයම කැමැත්තෙන් පසුවන බවත් ඒ සඳහා පාසල් ප්‍රතිපත්ති හා නීතිරීති ඇතැම් අවස්ථාවල බාධාවී ඇති බවත් අධ්‍යයනයෙන් අනාවරණය වු තොරතුරු ඇසුරින් නිගමනය කළ හැකි විය. මෙම අධ්‍යයනයෙන් හෙළිකර ගත හැකි වු තවත් ප්‍රධානතම කාරණයක් වුයේ පාසල් ප්‍රජා සබඳතා පවත්වා ගැනීම සම්බන්ධයෙන් පාසල් අතර විෂමතා පවතින බවය.